# පාස්කු ඉරුදින මංගල පූජා මෙහෙය

## පළමුවන දේව ප්‍රකාශනය ක්‍රියා 10: 34, 37–43

*අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් උපුටා ගත් කොටසකි.*

මළවුන්ගෙන් උත්ථාන වූ ස්වාමීන් වහන්සේ සමඟ
අපි ආහාර පාන වැළඳුයෙමු.

එවිට පේදුරු මෙසේ කී ය. "දෙවියන් වහන්සේ මිනිසුන්ගේ තරාතිරම් නොබලන බව දැන් මට සැබැවින් ම පැහැදිලි ය. ජොහන් ප්‍රකාශ කළ බව්තීස්ම–ස්නාපනයට පසු ගලීලය පටන් ජුදය මුළුල්ලෙහි සිදු වූ දේ ඔබ දන්නහු ය: දෙවියන් වහන්සේ ශුද්ධාත්මයෙන් ද බලයෙන් ද නාසරෙත්හි ජේසුස් වහන්සේ ආලේප කළ සැටිත්, දෙවියන් වහන්සේ උන් වහන්සේ සමඟ සිටි බැවින්, උන් වහන්සේ යහපත් ක්‍රියා කරමින් ද යක්ෂයා විසින් පීඩා කරන ලද සියල්ලන් සුව කරමින් ද හැසුරුණු සැටිත් ඔබ දන්නහු ය. උන් වහන්සේ ජුදෙව්වරුන්ගේ රටෙහි ද ජෙරුසලමෙහි ද කළ සියල්ලට අපි සාක්ෂිකරුවෝ වම්හ. ඔව්හු උන් වහන්සේ ගසක එල්ලා මැරූ හ. එහෙත් දෙවියන් වහන්සේ තුන් වන දා උන් වහන්සේ උත්ථාන කොට දර්ශනය වන්නට සැලැස්සූ සේක.

උන් වහන්සේ සියල්ලන්ට ම පෙනුණේ නැත. පෙනුණේ, දෙවියන් වහන්සේ විසින් කලින් තෝරාගන්නා ලද සාක්ෂිකරුවන් වන, උන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ පසු උන් වහන්සේ සමඟ එකට කෑවා වූ, බීවා වූ, අපට ම ය. ජීවත් වන්නවුන්ගේ ද මළවුන්ගේ ද විනිශ්චයකාරයාණන් වන පිණිස දෙවියන් වහන්සේ විසින් නියම කරන ලද තැනැත්තාණන්, උන් වහන්සේ බව සෙනඟට ප්‍රකාශ කරන්නටත්, සාක්ෂි දෙන්නටත්, උන් වහන්සේ අපට අණ කළ සේක. උන් වහන්සේ අදහන සියල්ලනට උන් වහන්සේගේ නාමයේ අනුහසින් පව් කමාව ලැබෙන බවට සියලු දිවැසිවරයෝ සාක්ෂි දෙති"යි කී ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 118: 1–2, 16–17, 22–23

**පිළිතුර:** මෙන්න සමිඳුන්ගේ ජය මංගල දිනය: මේදින අපි ප්‍රීති සන්තෝෂ වෙමු.

**ගීය :** සමිඳුන්ට ස්තුති කරන්න. මන්ද, එතුමාණෝ යහපත් ය.
එතුමන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේ ය.
“එතුමන්ගේ තිර පෙම සදාකාලයට පවත්නේ ය”යි
ඉශ්රායෙල් දැන් කියත් වා!

සමිඳුන්ගේ බාහු බලය උදාර ය.
සමිඳුන්ගේ බාහු බලය විකුම් දක්වයි.
මම නොනැසී, ජීවත් ව සිටින්නෙමි:
සමිඳුන්ගේ ක්‍රියා ප්‍රකාශ කරන්නෙමි.

ගෘහ ශිල්පීන් ඉවත ලූ ගල ම මුල් ගල වී ඇත.
මෙය සමිඳුන්ගේ ක්‍රියාව කි:
එය අපේ දෙනෙතට අසිරිමත් ය.

## දෙවන දේව ප්‍රකාශනය කොලොස්සි 3: 1–4

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් කොලොස්සිවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

### ක්‍රිස්තුන් වහන්සේ වැඩසිටින තැන ඇති, ලෝකෝත්තර දේ සොයා යන්න.

ඔබ ක්‍රිස්තුන් වහන්සේ සමඟ උත්ථාන කරනු ලැබූ බැවින්, දෙවියන් වහන්සේගේ දකුණු පස වැඩ හිඳින ක්‍රිස්තුන් වහන්සේ වැඩ සිටින තැන ඇති, ලොව්තුරු දේ ප්‍රාර්ථනා කරන්න. ලෞකික දේ කෙරෙහි නොව, ලොව්තුරු දේ කෙරෙහි ඔබේ සිත යොමුකරන්න. මන්ද, ඔබ මැරුණු බැවින් දැන් ඔබේ ජීවිතය ක්‍රිස්තුන් වහන්සේ සමඟ දෙවියන් වහන්සේ තුළ සැඟවී පවතියි. අපේ ජීවනය වන ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ වන විට, ඔබත් උන් වහන්සේ සමඟ තේජසින් ප්‍රකාශ වනු ඇත.

*දේව වචනය මෙසේ ය.*

*(නැතහොත් පහත සඳහන් පාඨයද දෙවැනි දේව ප්‍රකාශනය සඳහා යොදාගත හැක.)*

## 1 කොරින්ති 5: 6–8

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

### පරණ මුහුන් ඉවත්කර නව නුමුහුන් පිටි පිඬක් වන්න.

ඔබගේ පාරට්ටුව නොහොබී. මුහුන් බිඳකින් මුළු පිටි පිඬක් පිපෙන බව ඔබ නොදන්නාහු ද? ඔබ හැම අතින් ම පිරිසිදු වන පිණිස පාපය නමැති මුහුන් ඉවත් කරන්න. එවිට ඔබ අලුත් නුමුහුන් පිටි පිඬක් මෙන් වන්නහු ය. ඔබ දැනට ම එසේ බව මම දනිමි, එසේ වන්නේ අපේ පාස්කු බැටළුවා වන ක්‍රිස්තුන් වහන්සේ පූජා කර ඇති බැවිනි. එබැවින් පරණ මුහුන්වලින් වත්, ඊර්ෂ්‍යාව හා දුෂ්ටකම නමැති මුහුන්වලින් වත් නොව, අවංකකම ද සත්‍යය ද නමැති නුමුහුන් රොටියෙන් පාස්කු මංගල්‍යය පවත්වමු.

*දේව වාක්‍යය එසේ ය.*

### පාස්කු ගීය

තුටු වව්, තුති දෙව් කිතුණුවනේ
සම්දුන් හට මේ මගුල් දිනේ
නිමලවූ දෙව් අජබාලකයෝ
පව් කිළිටෙන් අප සැම මිදුවෝ
පිටු පා ගිය මනු කැළ එතුමෝ
සිය දෙව් පිය වෙත හැරලූවෝ

ජීවය දෙන සිරි කුමරුන් හා
සටන් වැදී පොරබැදි මරුවා
මරු මුව පත් මුත් දෙව් කුමරා
නැග සිටි මරණින් දෙව් තෙද පා
මරියනි කිව මැන ඔබ දුටුවේ
කිමෙක්ද සොහොනට යන ගමනේ

දුටුවෙමි මා සමිඳුගේ මහිමේ
මරණින් නැගී සිටි තෙද මහිමේ
කිතු සමිඳුන් වැළ ලූ සොහොනේ
දෙව් දුතු තුටු නද දෙනු ඇසුණේ
මළ කඩ පමණෙකි එහි තිබුණේ
දිව් දෙන දිනකර නැග තිබුණේ

මා හද පුරවන කිතු සමිඳුන්
ඔබටද සමුවේ ඇදහිලිවන්
විකුමැති රජිඳුනි ඔබ මරණින්
නැගි සිටි බව අදහමු අපි දැන්
සිටිමුව අපි සැම ඔබ යදිමින්
අප හට නිති කරුණා වන මෙන්

## සුපුවත් ජය නද 1 කොරින්ති 5: 7–8

ආලේලූයා! ආලේලූයා!
අපගේ පාස්කු බැටළුවා වන
ක්‍රිස්තුන් වහන්සේ පූජා කරනු ලැබූ සේක.
එබැවින් අප සැම ඒ මංගල්‍යය උත්සවාකාරයෙන් පවත්වමු.
ආලේලූයා!

## සුවිශේෂය ජොහන් 20: 1–9

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් නැගිට වදාළ යුතුමය.

සතියේ පළමු වන දා හිමිදිරියේ ම අඳුර තිබිය දී මග්දලායේ මරියා සොහොන් ගෙය ළගට අවුත්, සොහොන් ගෙයින් ගල ඉවත්කොට තිබෙන බව දුටුවා ය. එබැවින් ඈ සීමොන් පේදුරු ද ජේසුස් වහන්සේ ප්‍රේම කළ අනිත් ශ්‍රාවකයා ද වෙත දුව ගොස්, “ඔවුන් සමිඳාණන් වහන්සේ සොහොන් ගෙයින් ඉවතට ගෙන ගොස් තිබේ: ඔවුන්

උන් වහන්සේ කොතැනක තැබුවා ද කියා අපි නොදනිමු"යි කීවා ය. එවිට පේදුරු ද අනික් ශ්‍රාවකයා ද නික්ම විත් සොහොන් ගේ දෙසට ගියහ. දෙදෙනා ම එක් ව දිව්වෝ ය. අනික් ශ්‍රාවකයා පේදුරු පසු කර දිව ගොස් පළමුවෙන් සොහොන් ගෙට පැමිණ, නැමී බලා, සිහින් හණ රෙදි එහි තිබෙන බව දිටී ය.

එහෙත් ඔහු ඇතුළට නොගියේ ය. සීමොන් පේදුරු ඔහුට පසුව පැමිණ සොහොන් ගේ ඇතුළට ගොස්, හණ රෙදි එහි තිබෙන බවත්, උන් වහන්සේගේ හිස ඔතා තිබූ රෙදි කඩ, හණ රෙදි සමඟ නොව, වෙන ම එක් තැනක අකුළා තිබෙන බවත් දුටුවේ ය. එකල සොහොන්ගේ ළඟට පළමුවෙන් පැමිණි ඒ අනෙක් ශ්‍රාවකයා ද, ඇතුළට ගොස් දැක විශ්වාස කළේ ය. උන් වහන්සේ මළවුන්ගෙන් නැගිට වදාළ යුතු යයි ලියන ලද ශුද්ධ ලියවිල්ල, ඒ වන තුරු ඔවුන් තේරුම් ගෙන සිටියේ නැත.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

